ඇමුණුම - 4

ඇමුණුම - 03

# සමස්ත ලංකා සිගරට් දුම් උදුන් හිමි සංගමය
# All Ceylon Cigarette Tobacco Barn Owner's Association

2016 සැප්තැම්බර් 12

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ජනාධිපති මන්දිරය,
කොළඹ.

අතිගරු ජනාධිපතිතුමණි,

<u>ගෞරවනීය අවධානය පිණිස කෙරෙන අභියාචනයයි.</u>

මේ ලිපිය ලියන මා 2015 ජනවාරි මස 08 දින පැවති ජනාධිපතිවරණයේ දී ඔබතුමාගේ ජයග්‍රහණය උදෙසා මෙන්ම, 2015 අගෝස්තු 17 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ දී යහපාලන රජයේ ජයග්‍රහණය උදෙසා ද සෘජුවම හා සක්‍රියව දායකවූ ද, ඉදිරි මැතිවරණ සියල්ලෙහිදීම යහපාලන රජයේ ජයග්‍රහණය උදෙසා නොඅනුමානවම කැපවෙනු ඇත්තාවූ ද, කලක් පලාත් සභා මන්ත්‍රීවරයෙකුව සිට මා නියෝජනය කරන ජන පදනම සමග දිගු කාලයක් තිස්සේ පලාත් මට්ටමින් ක්‍රියාකාරී දේශපාලනයේ නියැලී සිටින්නාවූ ද, පුද්ගලයෙක් වෙමි.

ජාත්‍යන්තර ප්‍රජාව විසින් අප රට කොන් කරමින් කටයුතු කරන්නට යෙදුන සමයක, එම ප්‍රවාහය ආපිට හරවා සංහිඳියාවේ පූර්වාදර්ශය ලොවට පසක් කරමින්, එම ජාත්‍යන්තර ප්‍රජාවේම ගෞරවයට පාත්‍රවූ, ඔබතුමන් විසින් දුම්කොළ හා මධ්‍යසාර පාලනය, වකුගඩු රෝග නිවාරණය, ආදී සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිදුකලා වූ සේවය උදෙසා මෑතක ලෝක සෞඛ්‍ය සංවිධානයේ සම්මානයට පාත්‍රවීම පිළිබඳ මුලින්ම අපගේ සුබපැතුම් පිරිනමමු. මේ සම්මානය සඳහා ඔබතුමාගේ සංකල්පයට අනුකූලව 2020 දී දුම්කොළ වගාව අවම කිරීමේ අරමුණින් ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මැතිතුමන්ගේ උපදෙස් පරිදි ආචාර්යය එච්.එම්.එස්. හීන්කෙන්ද මැතිතුමා අප සමග අරඹා ඇති සාධනීය, සංහිඳියාත්මක, පුරෝගාමී වැඩ පිළිවෙල ද සුළුවෙන් හෝ දායක වන්නට ඇති බව අපි තරයේ විශ්වාස කරමු.

මෙම ලිපිය අඩංගු ලිපි ශීර්ෂය ඔබතුමාගේ ප්‍රසාදය පිණිස නොවන බව දනිතත්, ජනතා දුක හඳුනන, ජනතා මිත්‍ර, ජනතා පුත්‍ර, ගැමි ජනපතිඳුන් ලෙස මෛත්‍රී සිතින් මෙම ලිපිය අවසානය දක්වා කියවා අපගේ දුක්ගැනවිල්ල පිළිබඳ මැදහත් සිත් යොමන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

1. රාජ්‍ය අනුග්‍රහය මත හඳුන්වා දී, පරම්පරා තුනක් තිස්සේ පවත්වාගෙන එන ලද වගාවක් ක්ෂණිකව ඉවත් කිරීමෙන් අප අසීරුවට පත් නොකර, විකල්ප ආදායම් මාර්ග හඳුන්වාදෙමින් අප ජීවිකාව වෙනතකට යොමුකර, 2020 දී වගාව පිළිබඳ අවසන් තීන්දුව ගන්නා පිළිවෙතකට ඔබතුමන් යොමුවීම පිළිබඳ මුලින්ම අපගේ ගෞරවය පුදකරමු.
2. 300,000 ට ආසන්න යැපෙන්නන් පිරිසකින් සමන්විතව, රැකියා අවස්ථා 60,000 ක් පමණ උත්පාදනය කර, නිෂ්පාදනය මිලදී ගැනීම හරහා ග්‍රාමීය ආර්ථිකයට රුපියල් කෝටි 150 (දසලක්ෂ 1500) කට අධිකව මුදාහරින, ජාතික බදු ආදායමට කෝටි 9,200 (දසලක්ෂ 92,000) කින් පමණ පමණ දායකත්වය සපයන කර්මාන්තයක නියැලී අප, මේ වැඩ පිළිවෙල ඔස්සේ සාකච්ඡා අරඹා ඇතත්, අද වනතුරු කිසිදු මාධ්‍යය සාකච්ඡාවක් පවත්වා


| සම සභාපති | සම ලේකම් | සම භාණ්ඩාගාරික |
|---|---|---|
| ජේ.ඒ.එගොඩවෙලේ (081-3847141) | ජෝර්ජ් නිසිවාසල (081-3840797) | එන්.එච්.සුනිල් ද සිල්වා (081-4917168) |
| ඩබ්.එම්.සෝමරත්න (071-5684062) | ඩබ්.එම්.ගුණරත්න (077-7469076) | පී.ජී.විජේසූරිය (072-4256475) |

අප පාර්ශවයෙන් කරුණු දක්වා නැත්තේ, ඔබතුමා ප්‍රමුඛ යහපාලන රජයෙන් අපට සාධාරණය ඉටුවනු ඇත දැඩි විශ්වාසයකින් යුතුව පවත්වාගෙන යන ස්වයං විනය, හික්මීම සහ වාරණය හේතුවෙනි. ඉතා සුළු දෙයට මාධ්‍ය සංදර්ශන පවත්වන වකවානුවක මෙය ඔබතුමාගේ ගෞරවනීය අවධානයට යොමුවී ඇතැයි අපි තර විශ්වාස කරමු.

3. රාජ්‍ය ප්‍රතිපත්තිය මත 2020 දී දුම්කොළ වගාව පිළිබඳ තීන්දුවට එළඹෙන තුරු අප, අපගේ ජීවන වෘත්තියෙ යෙදිය යුතුය. අපගේ අඹුදරුවන් ඉන් පෝෂණය කළ යුතුය. මෙය අප සාකච්ඡා වලදී මූලිකවම අවධාරණ කරන ලද කරුණකි. ඒ අනුව මේ වන විට අපගේ සාමාජිකත්වය දුම්කොළ වගාවට අවතීර්ණ වී ඇත. නමු ඇතිවී ඇති වාතාවරණය හමුවේ අපේක්ෂිත වපසරියෙන් 65% ක් වත් වගාකරගැනීමට අප සාමාජිකත්වය හැකිවී නැත. මේ සඳහා බලපෑ ප්‍රධානතම සාධකය වන්නේ ඉහල මට්ටමේ රාජ්‍යය නිළධාරියා සිට පහ මට්ටමේ රාජ්‍යය නිළධාරියා දක්වා විවිධ අවස්ථාවලදී සිදුකරන ලද අයුතු බලපෑම් හා තාඩන පීඩනයි. මෙ සඳහා ඔවුන් දඩමීමා කරගන්නේ ඔවුනගේ අභිමතය පරිදි නිර්වචනය කරන ලද ඔබතුමන් විසින් මාධ්‍යය සිදුකරන ලද ප්‍රකාශ වීම, අවධානයට ලක් විය යුතු කරුණකි. මාධ්‍යය හරහා ප්‍රකාශයට පත්වන්නේ සංස්කරණ කරන ලද ප්‍රකාශ වීම මේ තත්ත්වය තවදුරටත් උග්‍රකිරීමට හේතුවන බව අපගේ විශ්වාසයයි. මේ හේතුකො ගෙන කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැඩපිළිවෙල ක්‍රියාත්මක වීමට පෙරම අප ජීවිකාව බිඳ වැටීම තුල, අ සමාජිකත්වය දැඩි අපේක්ෂා භංගත්වයකට පත්ව, රජය ඉදිරිපත්කර ඇති වැඩපිළිවෙලේ විශ්වාසනීයත්ව පිළිබඳව ප්‍රශ්න කිරීම අරඹා ඇත. ඒ හේතු කොටගෙන අද දක්වා අප විසින් පවත්වා ගන්නා ලද සංහිඳියාව අභියෝගයට ලක්වන තත්ත්වයක් උද්ගතව ඇත.

4. අප අපේක්ෂිත දුම්කොළ වපසරිය වගා නොකිරීම හේතුවෙන් ලංකා දුම්කොළ සමාගම දුම්කොළ ආනයනයට යොමුව ඇති බව දැනගන්නට ලැබී ඇත. එමගින් අහිමිවීමට නියමිත අතිවිශාල විදේශ විනිමය ප්‍රමාණය ආදායමක් ලෙස දේශීය ගොවියාට උපද්දවාගැනීමට තිබූ අවස්ථාව නොලැබියාම පිළිබඳ අපි දැඩිසේ කණගාටුවට පත්වෙමු.

5. වාර්ෂික බෝග වගා කරන වපසරියෙන් 0.01% ක් පමණ (හෙක්ටාර 2,500) වූ වපසරියෙන් අප විසින උපද්දවනු ලබන ආදායම වී වගාවෙන් උපද්දවන්නේ නම්, ඒ සඳහා වී කිලෝ ලක්ෂ 375 ක් නිෂ්පාදනය කළ යුතුය. මේ වෙනුවෙන් රජයේ පොහොර සහනාධාරයද ලබාදී හෙක්ටාර 7,500 ක තරම් වී වගා කල යුතුය. වී අතිරික්තයක් පවතින රටක මෙය වී ගොවියා කෙරෙහි තවදුරටත් ඉතා අහිතකර ලෙස බලපානු ඇත.

6. සිගරට් කර්මාන්තයට එල්ල වන විවිධ විවේචන දුම්කොළ වගාකරුවන්ට ආරෝපණය කර අප හොර අරක්කු පෙරණ, මත්කුඩු විකුණන දරුණු පාතාල ගණයේ අපරාධකරුවන් ලෙස හුවාදැක්වීමට ඇතමුන් යොමුවී තිබීමද මෙහි අනිටු ප්‍රතිඵලයක් ව ඇත. අප නීත්‍යානුකූල වගාවක නියැලෙමින් ජීවිකාව සරිකරගන්නා ගොවීන් ලෙස නොසලකා, සමාජ විරෝධී පිරිසක් ලෙස සැළකීම අප උග්‍ර මානසික අර්බුදයකට ඇද දමන තත්ත්වයක් නිර්මාණය කර ඇත. මෙය වඩාත් බරපතල හා කණගාටුදායක බවට පෙරළෙන්නේ අපගේ දරුවන් දැඩි මානසික පීඩනයකට ලක්ව පාසල හා සමාජය තුල කොන් කිරීම හේතුකොට ගෙනය.

7. මේ සියළු තත්ත්ව දුම්වැටි වෙළඳපොලේ 55% ක් තරම් වන, සිගරට් දුම්කොළ කර්මාන්තය සඳහා අදාල කරගෙන ඇතත්, දුම්වැටි වෙළඳපොලේ 45% වන බීඩි හා සුදු බීඩි කර්මාන්තය සමග බැඳී ඇති බීඩි දුම්කොළ වගාව සඳහා හෝ අනෙකුත් කිසිදු දුම්කොළ වගාවකට අදාල කරගන්නා බවක් පෙනෙන්නට නැති වීම බලවත් කණගාටුවට කරුණකි. ඒ මන්දයත්, එම නිෂ්පාදන ද දුම්පානයේ අනිටු ඵල විපාක සඳහා දායක වන බැවිනි.

ඉහත කරුණු හේතුවෙන් අප පත්ව ඇති දුර්භාග්‍යය සැලකිල්ලට ගෙන පහත යෝජනා සඳහා ඔබතුමාගේ ගෞරවනීය අවධානය හා අනුග්‍රහය සලසනු ඇතැයි අපේක්ෂා කරමු.

ඇමුණුම - 03

අ - මාධ්‍යය භාවිතයේදී සිගරට් කර්මාන්තය හා දුම්කොළ ගොවියා වෙන වෙනම සළකා කටයුතු කිරීම තුලින් අප පත්ව ඇති මානසික පීඩාව අවම කිරීමට කටයුතු කිරීම. එමගින් ගොවීන් වන අප තවදුරටත් සමාජ විරෝධීන් ලෙස හුවාදැක්වීම නවතා දැමීම.

ආ - සිගරට් දුම්කොළ වගා පාලනයට අදාල සැළසුම් 2020 දී කෘෂිකර්ම අමාත්‍යංශය හරහා ක්‍රියාත්මක වන තුරු අත්තනෝමතික ලෙස බලපෑම් කරමින් දුම්කොළ ගොවියා නොපෙළන, ලෙස රාජ්‍ය නිළධාරීන් දැනුවත් කිරීම. ඒ හරහා රජයේ වැඩ පිළිවෙල කෙරෙහි දුම්කොළ ගොවියාගේ විශ්වාසය දිනාගැනීම.

ඇ - දුම්වැටි යන්නෙන් සිගරට් පමණක් නොව බීඩි, සුදු බීඩි, සුරුට්ටු හා අනෙකුත් දල්වන දුම්කොළ නිෂ්පාදන සියල්ලද අර්ථගැන්වෙන බව අවධාරණය කර, සමස්ත දුම්වැටි කර්මාන්තයම ආවරණය වන පරිදි දුම්වැටි නිවාරණ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුලින් එකී ප්‍රතිපත්තියේ වටිනාකම තහවුරුකිරීම.

අතිගරු ජනාධිපතිතුමණි, අමුද්‍රව්‍යයක් ලෙස දුම්කොළ නිපදවීමේ අවශ්‍යතාවය සිගරට් කර්මාන්තය පවතිනතාක් නොවෙනස්ව පවතිනු ඇත. එම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන රජයට ද බරක් නොවී, ආදායමක් උපදවා ගැනීමට අප ගොවීන්ට ඇති අවස්ථාව ආරක්ෂාකරදීම පිළිබඳ නැවත සලකාබලන ලෙස ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු. ඔබතුමා මුනගැසී මේ පිළිබද වැඩිදුර කරුණු දැක්වීම සඳහා ඔබතුමාගේ අගනා කාලයෙන් සුළු කාලයක් අප සංගමය වෙත ලබා දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

ස්තූතියි.

මෙයට,

විශ්වාසී,

ජේ. ඒ. එගොඩවෙලේ
ගරු සභාපති

ජේ.ඒ.එගොඩවෙලේ
සම සභාපති - සමස්ත ලංකා සිගරට් දුම් උදුන් හිමි සංගමය